නිපුණතාව 12.0 - පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.8 – සාර්ථක සංවිධානකරණයකදී අවධානය යොමු කළ යුතු සංකල්ප විග්‍රහ කරයි.

- අණ කිරීමේ දාමය - සංවිධානයේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය තෙක් නොකැඩුණු අධිකාරී මාර්ගය
- අණ කිරීමේ ඒකීයතාවය - එක් සේවකයෙකු එක් සුපරීක්ෂකවරයෙකුට පමණක් වග කිව යුතුය යන මූලධර්මය
- පාලන අවකාශය/පාලන විතස්ථිය -එක් කළමනාකරුවෙකුට සෘජුව වාර්තා කරනු ලබන සහායකයන් සංඛ්‍යාව
- අධිකාරිය හෙවත් බලතල - විවිධ කාර්ය කිරීම සඳහා හෝ අණ කිරීම් සඳහා හෝ සම්පත් බෙදා හැරීම සඳහා හෝ සංවිධානයක කළමනාකරුවෙකුට ලැබෙන නීත්‍යානුකූල බලය
- බලය - පුද්ගලයෙකුට තමාගේ තත්ත්වය හෝ තනතුර හෝ අනුව ලැබෙන විධිමත් අධිකාරියත් ඊට අමතරව වෙනත් මාර්ගවලින් ලැබෙන හැකියාවත්ය.

<u>අභ්‍යාස</u>

1.බලය ලැබෙන මූලාශ්‍ර මොනවාද?
2.මධ්‍යගතකරණය යනු කුමක්ද?එහි වාසි හා සීමා දක්වන්න.
3.විමධ්‍යගතකරණය යනු කුමක්ද?එහි වාසි හා සීමා දක්වන්න.
4.සංවිධානයක විවිධ ශ්‍රිත (කාර්ය) හෝ දෙපාර්තමේන්තු හෝ බෙදී ඇති ආකාරය සිරස් සංවිධාන සටහන,තිරස් සංවිධාන සටහන හා චක්‍රීය සංවිධාන සටහනක් මගින් දක්වන්න.